**පුත්තලම නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 11 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පුත්තලම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.72,000ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | මේ පිළිබඳ නිරවද්‍යතාවය සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සභා සතු වත්කම් 67ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | සභා සතු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | වත්කම්වල අයිතිය නීත්‍යානුකූලව ලැබීමෙන් පසුව වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | බස් නැවතුම්පොල නාම පුවරුව සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.584,000ක වටිනාකම ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණද, වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020.01.01 දිනැති ජර්නල් වවුචර් අංක 680 මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (iv) | 2018 වර්ෂය වෙනුවෙන් මුද්දර ගාස්තු බිල්කළ ප්‍රමාණය ඉක්මවා ලැබී තිබුණු රු.3,217,601ක් | මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | රු.3,217,601ක මුද්දර ගාස්තු අදාළ ගිණුම්වල ගැලපුම් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපුම් කළ යුතු වුවත්, මුද්දර ගාස්තු ගිණුමේ සටහන් කිරීම නිසා එම වටිනාකමින් මුද්දර ගාස්තු හිඟය අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (v) | ණයහිමියන් ලෙස සනාථ කළ නොහැකි රු.588,777ක්, සැපයුම් ණයහිමි සෘණ ශේෂයක් ලෙස සාවද්‍යව ගිණුම්ගත කර තිබීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයහිමි වටිනාකම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදාළ ගෙවීම් සම්බන්ධයෙන් සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | 2020 ජනවාරි 01 දින සිට එකතු කළ අගය මත බදුවලින් නගර සභාව නිදහස් කර තිබුණද, කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු ලෙස හිලව් කළ නොහැකි රු.3,516,397ක බදු මුදලක් අයකර ගත හැකි ශේෂයක් ලෙස ගිණුම්වල පෙන්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | මෙම මුදල අය කර ගැනීම සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නීති අංශය වෙත ගොස් සාකච්ඡා කර ඉදිරි කටයුතු කරමි. |
| (vii) | අයකරගත හැකි ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණු ඉහත (vii)හි සඳහන් රු.3,516,397ක බදු මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු තැන්පත් යටතේ සෘණ ශේෂයක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉහත ලැබිය යුතු එකතු කළ අගය මත බද්ද සම්බන්ධව නිශ්චිත තීරණයකට එළඹීමෙන් පසුව නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් ගිණුම හා සේවක ඇප ආයෝජන ගිණුම අතර, රු.22,570ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදාළ වැරදි නිවැරදිකර ගිණුම්වල ශේෂ අතර වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ix) | අනියම් සේවකයින් සඳහා ගෙවන ලද රු.55,081ක් සංවර්ධනය නොකළ ඉඩම් මත අය කරන බදු නැමැති ආදායම් ගිණුමට හර කිරීම හේතුවෙන් එම වටිනාකමෙන් අදාළ වියදම් | කාල පරිච්ඡේදයට අදාළ ආදායම් හා වියදම් නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වේ. | අනියම් සේවකයින් සඳහා රු.55,081ක අනියම් දීමනා ගෙවීම (වියදම්) සංවර්ධනය නොකළ ඉඩම් මත අය කරන බදු ගිණුමේ (ආදායම්) සටහන් වීමෙන් වරදක් සිදුව ඇත. |

| | | | |
|---|---|---|---|
| | හා ආදායම් අඩුවෙන් දක්වා තිබුණි. | | ඉදිරියේදී එවැනි වැරදි සිදු නොවන ලෙස ගිණුම් තැබීමට කටයුතු කරමි. |
| (x) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිගුකාලීන වගකීම් යටතේ වර්ෂය අවසානයේ දක්වා තිබුණු රු.173,168,385ක ලාභාලාභ ශේෂය සඳහා ලෙජර ගිණුමක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. වර්ෂය ආරම්භයේ ලාභාලාභ ශේෂයට සමාලෝචිත වර්ෂයේ ලාභය ගැලපූ පසු ශේෂය රු.173,622,615ක් විය යුතු වුවත් මෙම ශේෂ අතර රු.454,230ක වෙනසක් පැවතුණි. | සෑම ගිණුම් අයිතමයකට අදාළව ලෙජර ගිණුමක් ලබාගත හැකි පරිදි මෘදුකාංගය සකස් කරගත යුතු වේ. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සෑම ශේෂයකටම අදාළව ලෙජර ගිණුමක් මෘදුකාංගයෙන් ලබා ගත හැකි වුවද එහි ලාභ/අලාභ ලෙස දක්වා තිබූ ශේෂය සඳහා ගිණුමක් මෘදුකාංගය තුළින් ලබාගත නොහැකි විය. |
| (xi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඇල්ෆා වෙළඳ සංකීර්ණයේ ලැබිය යුතු ටෙන්ඩර් ආදායම රු.96,271,601ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ඉන් රු.57,757,000ක් ඉකුත් වර්ෂවලට අදාළ ටෙන්ඩර් ආදායම් විය. ඒ අනුව එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩිපුර දක්වා තිබුණි. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2019.12.31 දිනට ඇල්ෆා වෙළඳ සංකීර්ණයෙන් ලැබිය යුතු ටෙන්ඩර් ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.96,271,601ක වටිනාකමට අදාළ තොරතුරු මේ සමග ඉදිරිපත් කරමි. |
| (xii) | ඇල්ෆා වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි. | කාල පරිච්ඡේදයට අදාළ ණයහිමියන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමට පෙර නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

---------------------

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| ගිණුම් විෂයයකට අදාළව ඉදිරිපත් කළ උපලේඛනයන් / උපයෝගී පොත් අනුව ශේෂයන් හා මූල්‍ය | සේවක ඇප ගිණුම හා සේවක ඇප ආයෝජන ගිණුම නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |

ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම් එකතුව රු.171,707ක් විය.

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු ගිණුම් ශේෂ 04ක එකතුව රු.335,967,462ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.107,270,511ක් විය. තවද එදිනට වෙනත් ණයගැති උපලේඛනයට අනුව 2009 වර්ෂයට පෙර සිට අයවිය යුතුව තිබුණු රු.21,590,806ක් අයකර ගැනීම අවිනිශ්චිත විය. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | මෙම හිඟ ශේෂයන් වසර ගණනාවක සිට අවසන් ගිණුම්වල පෙන්නුම් කරන බවත් භාවිතා කරන පරිගණක මෘදුකාංගයේ දෝෂයන් හේතුවෙන් වැරදි ලෙස ගණනය වීමට අදාළ නිවැරදි කිරීම් මේ වන විට සිදු කරමින් පවතින අතර, හඳුනාගත් හිඟ ආදායම් එකතු කිරීමටද කටයුතු කරමින් පවතී. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02ක එකතුව රු.76,844,905ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ගෙවිය යුතු වටිනාකම රු.42,176,641ක් විය. | තවදුරටත් ගෙවිය යුතු ණයහිමි ශේෂ නිරවුල් කළ යුතු වේ. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක හා විගණකාධිපති වෙත ගෙවිය යුතු මුදල් වාරික වශයෙන් මාසිකව බැංකු ස්ථාවර නියෝග මගින් ගෙවීම් කරනු ලබන අතර, ගෙවිය යුතු ඉතිරි ශේෂය සම්බන්ධව සොයා බලා 2019 අවසන් ගිණුම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.189,673,215ක් වූ ගිණුම් විෂයයන් 09ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරියේදී ඉදිරිපත් කරමි. |

## 1.4 අනුකූල නොවීම්

--------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සහා ආඥා පනත (255 වන අධිකාරිය) | | | |
| | (i) 33 වගන්තිය | සහාව සතු නිශ්චිත දේපළවල අයිතිය තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | දේපළ අයිතිය තහවුරු කෙරෙන ලේඛන පැවැත්විය යුතු වේ. | ඉඩම් කැබලි 14 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇති අතර, ඉතිරි වත්කම් සියල්ල නියමිත මිනුම් කටයුතු සිදුකර පවරා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලා ඇත. |
| | (ii) 177(2) වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සාරාංශයක් මහජනතාවගේ දැනගැනීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | නගර සහා ආඥා පනතේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | VIII පරිච්ඡේදයේ 10.1 වගන්තිය | 1/20 දීමනා හිමිකම් නොමැති කාර්මික නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී 1/20 දීමනා වෙනුවෙන් රු.41,749ක් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහය විධිවිධාන පරිදි දීමනා ගෙවිය යුතු වේ. | අංක EI/7/1/7/17 හා 2000.03.30 දිනැති පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපියට අනුව කාර්මික නිලධාරී මහතා සේවයේ යෙදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මු.රෙ. 565(3)(4)හා(5) | ඉකුත් වර්ෂවල තැන්පතු ලෙජරවල ශේෂ ඉදිරියට ගෙන ගොස් නොතිබුණු අතර මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශනද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) මු.රෙ. 571(2) | සභාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 03ට වැඩි රු.2,716,226ක මුදලක් තැන්පත් ගිණුම්වල පවත්වාගෙන යමින් තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | තොරතුරු නිවැරදිව ගණනය කර 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iii) මු.රෙ. 1647(අ),(ආ) | වාහන අළුත්වැඩියාව සඳහා අළුතින් සවි කරන අමතර කොටස් හා ගලවා ඉවත් කළ අමතර කොටස් ද්‍රව්‍ය ගබඩා බැරපත මගින් ලේඛනගත කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ලේඛනගත කර විගණනයට ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 8.9.1(අ) | අංක 49-9915 දරන ට්‍රැක්ටර් රථය රු.618,700ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු නමුත් ඒ සඳහා විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වේ. | මෙවැනි වැරදි ඉදිරියේදී සිදු නොවීමට වග බලාගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii)8.9.1(ආ) | කුලී පදනම මත වාහන ලබා ගැනීමේදී විධිමත් ගිවිසුමක් අත්සන් කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුල රු.6,334,052ක් ගෙවා තිබුණි. | විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වේ. | රාජකාරීමය අවශ්‍යතා මත වාහන කුලියට ගෙන ඇති බව වාර්තා කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.145,727,308ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,213,251ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

නගර සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| - වරිපනම් හා බදු | 25,533 | 23,933 | 23,043 | 106,478 | 26,056 | 23,933 | 12,930 | 106,308 |
| කුලී | 11,276 | 13,456 | 16,112 | 30,193 | 38,014 | 17,433 | 34,389 | 32,021 |
| බලපත්‍ර ගාස්තු | 1,220 | 870 | 870 | - | 1,001 | 899 | 899 | - |
| වෙනත් ආදායම් | 612,448 | - | 146,189 | - | 410,974 | - | 188,753 | - |
| | 650,477 | 38,259 | 186,214 | 136,671 | 476,045 | 42,265 | 236,971 | 138,329 |

සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ පසුගිය වර්ෂවල හිඟ ආදායම්වලින් ලැබීම්ද ඇතුලත්ව තිබේ.

#### 2.2.2 තොරතුරු ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදායම් පරිපාලනය පිළිබඳව සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඉහත වගුව පිළියෙල කර ඇති අතර එම තොරතුරුවල දෝෂ පැවතුණි. | විගණනය සඳහා නිවැරදිව තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී මෙවැනි දෝෂයක් ඇති වීමට ඉඩ නොතබන බවට වාර්තා කරමි. |

### 2.2.3 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හිඟ ආදායම් හා ණයගැති ශේෂ අයකර ගැනීම ඇතුළු සභාවේ සමස්ත ආදායම් රැස්කිරීම හා වාර්තාකරණය දුර්වල තත්ත්වයක පැවතුණි. | ආදායම් රැස් කිරීම කාර්යක්ෂමව සිදු කළ යුතු අතර, වාර්තාකරණය නිවැරදි විය යුතු වේ. | දීර්ඝ කාලයක් තිස්සේ වගකිව යුතු නිලධාරීන්ගේ හිඟයක් පැවතීම මේ සඳහා බලපා ඇති බව වාර්තා කරමි. |

### 2.2.4 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කළ වරිපනම් බදු මුදල වූ රු.23,933,142න් වර්ෂය තුළදී රැස්කරගෙන තිබුණේ රු.7,203,257ක් පමණි. එය බිල්කළ මුදලින් සියයට 30ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාවේ සමස්ත වරිපනම් බදු හිඟය ගිණුම අනුව රු.106,477,668ක් විය. | වර්ෂයේ බිල්කළ ආදායම් වර්ෂය තුළදීම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | එම වරිපනම් මුදල ඇතුළත දීර්ඝ කාලයක් පුරාවට අය නොවී වාර්ෂිකව ඇතුලත් වන විශාල වරිපනම් ප්‍රමාණයක්ද ඇති අතර, ඒවා කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර ඇත. |

### 2.2.5 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දේපළ බදුදීම මත 2009 වර්ෂයට පෙර සිට අය නොවන රු.19,453,493ක හිඟ කුලී ශේෂය අයවීම අවිනිශ්චිත තත්ත්වයක පැවති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කාලය වසර 03 ඉක්මවූ ශේෂය රු.9,246,996ක් විය. | හිඟ කඩ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟ ශේෂයන් 2009 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර, අවසන් ගිණුම්වල පෙන්නුම් කළද, තොරතුරු සනාථ කර ගැනීම සඳහා ලේඛන සොයා ගත නොහැක. |

### 2.2.6 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හිඟහිටි වෙනත් ආදායම් උපලේඛනය අනුව ටෙන්ඩර් | හිඟහිටි වෙනත් ආදායම් කඩිනමින් | ටෙන්ඩර් ආදායම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට |

| | | |
|---|---|---|
| ආදායම් ලෙස රු.1,029,527ක්ද, උසාවි දඩ ලෙස රු.729,185ක්ද හා දෛනික පොල ගාස්තු ලෙස රු.3,143,500ක්ද වශයෙන් එකතුව රු.4,902,212ක් වර්ෂ 03කට වැඩි කාලයක සිට හිඟව පැවති අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලේඛන කිසිවක් සොයා ගත නොහැක. අවසන් ගිණුම් සකස් කිරීම සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් සම්බන්ධව විස්තරයක් ලබාදෙන ලෙස අදාළ ආයතන වෙත ලිපියක් යොමුකර ඇත. ඉදිරියේදී අයකර අවසන් කිරීමට කටයුතු කරමි. |

### 2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.4,095,572ක් වූ අතර, සභාවට අයවිය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය හඳුනාගෙන අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | තවදුරටත් අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු නිසි පරිදි අයකර ගත යුතු වේ. | ලැබිය යුතු උසාවි දඩ මුදල් සම්බන්ධව විස්තර ලබාදෙන ලෙස අදාළ ආයතන වෙත ලිපියක් යොමුකර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 15ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා කිසිවක් පනවා ( නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා සමාජ සුභසාධනය උපරිම කිරීම සඳහා ක්‍රියාකළ යුතු වේ. | නගර සභාවට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා 06ක් පනවා ගැනීම සඳහා කටයුතු ආරම්භ කර ඇත. |

**ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් (සංවර්ධන සැලැස්ම නමින්) පිළියෙල කර තිබුණද 2014 පෙබරවාරි 17 දිනැති PED/RED/01/04/2014/1 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 04 ඡේදයට අනුකූල නොවිය. | අදාළ චක්‍රලේඛයේ දැක්වෙන පරිදි ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | අංක PED/RED/01/04/2014/1 දරන මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදයට අනුව ඉදිරි වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි. |
| (ii) | සභාව විසින් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබුණු කර්තව්‍යයන් 04ක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති සියළු කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතු වේ. | දේපළ තහනම් කිරීම, දේපළ තක්සේරු කිරීම හා තක්සේරු වාර්තා නිකුත් කිරීම, රථ ගාල් පාලනය, සුරතල් සතුන් හා උද්‍යාන නඩත්තුව හැර අනෙකුත් කටයුතු සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇති බව සඳහන් කරමි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ග කිලෝමීටර් 25.24කින් සමන්විත පුත්තලම නගර සභා සීමාව තුල දෛනිකව ජනනය වන කසළ ටොන් 16න් ටොන් 4ක් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා යොමු කර ඉතිරි කසළ කොම්පෝස්ට් අංගනය අසළ විවෘත ස්ථානයකට බැහැර කරමින් තිබුණි. එම භූමිය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබූ අතර කසළ අපහරණය හා කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | දෛනිකව එකතු කරන කසළ උපරිම මට්ටමින් ප්‍රතිචක්‍රීකරණය සඳහා යෙදවීමට අවධානය යොමු කළ යුතු වේ. | මෙම ව්‍යපෘතිය විශාල ප්‍රායෝගික ගැටළු රාශියක් මධ්‍යයේ නගර සභාව විසින් සිදුකරනු ලබයි. කොම්පෝස්ට් අංගනය පවතින ප්‍රදේශය ජන ශූන්‍ය වන අතර, එම අංගනය සඳහා ජලය සපයා ගැනීම ඉතා දුෂ්කර වී ඇත. මෙම තත්ත්වය යටතේ විශාල කාබනික පොහොර ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට හැකියාවක් ලැබී නොමැත. |

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක** --

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව නගර සභාව දැනුවත් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අරමුණු 04ක් යටතේ දිළිඳුකම තුරන් කිරීම, විවිධ ජාතීන් අතර සමගිය ඇති කිරීම, පරිසර සංරක්ෂණය හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇති කිරීම යනුවෙන් ඉලක්ක 04ක් හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිපාදන රු.1,525,000ක් වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල එම ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියා කළ යුතු වේ. | හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක 04 යටතේ සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන් 03ක් ක්‍රියාත්මක කරන ලදී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **කුලී පදනම මත වාහන සේවා ලබා ගැනීම**<br>සමාලෝචිත වර්ෂයේදී නගර සභාව කුලී පදනම මත වාහන 20ක් ලබාගෙන රු.6,334,652ක් ගෙවා තිබුණු අතර අයවැය ප්‍රතිපාදනයද ඉක්මවා වියදම් කර තිබුණි. කුලී පදනම මත වාහන ලබා ගැනීම සඳහා වර්ෂය මුලදී එක් ආයතනයක් පමණක් ලියාපදිංචි කරවාගෙන තිබුණු අතර ප්‍රසම්පාදන කටයුතු සිදු කළ බවට ලිඛිත සාක්ෂි නොතිබුණි. එසේම නිලධාරීන් විසින් වාහන ඉල්ලුම් කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | වාහන කුලියට ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා වාහන කුලී පදනම යටතේ එක් ආයතනයක් පමණක් සභාවේ ලියාපදිංචි වී ඇත. අප විසින් 2015 වර්ෂයේ ලියාපදිංචි කරන ලද ආයතනයක කි.මී.01ක් සඳහා රු.35ක මුදලකට අප වෙත සේවා සැපයීමට එකඟ විය. ඒ අනුව, අප විසින් මේ සම්බන්ධයෙන් එම ආයතනයෙන් සහාය ලබාගන්නා ලදි. වාහන ඉල්ලුම් කිරීමේ නිසි ක්‍රමවේදයක් දැනට ක්‍රියාත්මක වන බව වාර්තා කරමි. |
| (ආ) | **හිඟ ආදායම් එකතු කිරීමේ නිලධාරීන්ට කොමිස් මුදල් ගෙවීම**<br>2018 හා 2019 වර්ෂවල හිඟ ආදායම් එකතු කිරීමට නිලධාරීන් 04 දෙනෙක් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන තිබුණු අතර, එම පත් කිරීම් සඳහා සභා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. අංක 1984/19 හා 1984 නොවැම්බර් 20 දිනැති චක්‍රලේඛයේ 08 වගන්තියට අනුව ආදායම් එකතු කිරීම වෙනුවෙන් සියයට 7.5ක කොමිස් මුදලක් ගෙවිය යුතු වුවත් ඊට පටහැනිව සියයට 10 බැගින් රු.632,025ක කොමිස් මුදලක් ගෙවා තිබුණි | අදාළ නීතිරීතිවලට අනුව සේවකයින් බඳවා ගැනීම සහ කොමිස් මුදල් ගෙවීම සිදු කළ යුතු වේ. | නගර සභාව සඳහා ආදායම් පරීක්ෂක තනතුරු 04ක් අනුමත වී ඇතත් එක් ආදායම් පරීක්ෂක නිලධාරියෙක් පමණක් දැනට සේවයේ යෙදී ඇති බැවින් 255 අධිකාරය නගර සභා ආඥාපනතේ 36(අ) වගන්තිය යටතේ සභාපතිවරයා විසින් කොමිස් පදනම යටතේ හිඟ වරිපනම් බදු අය කිරීමට අදාළ පුද්ගලයින් පත් කර 10%ක කොමිස් මුදල් ගෙවීමට කටයුතු කර ඇත. |
| (ඇ) | **අතිකාල දීමනා ගෙවීම**<br>පුත්තලම නගර සභාවේ | වැඩ අංගනයට | විගණනයෙන් පෙන්වා දීමත් |

| | | | |
|---|---|---|---|
| | සේවය කරන සේවකයින් 36 දෙනෙකුට මසකට රු.200,000කට වැඩි මුදලක් අතිකාල වශයෙන් ගෙවා තිබුණු නමුත් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සටහන් තබා නොතිබුණු අතර අතිකාල ලේඛනයක්ද නඩත්තු කර නොතිබුණි. | සේවයට වාර්තා කරන කාර්යය මණ්ඩලය සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් ස්ථාපිත කළ යුතු අතර, අතිකාල ලේඛනයක් නඩත්තු කළ යුතු වේ. | සමඟ 2020.06.18 පැවති මහ සභාව විසින් වැඩ අංගනයට ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිළදී ගැනීමට අනුමත කර ඇත. ඒ අනුව, ඉදිරියේදී වැඩ අංගනය සඳහාද ඇඟිලි සළකණු යන්ත්‍රයක් මිළදී ගෙන මෙම ගැටළුවට විසඳුමක් ගන්නා බව වාර්තා කරමි. |
| (ඇ) | <u>අධිභාර ගෙවීම</u> | | |
| | නගර සභා සේවකයකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම මත පනවන ලද රු.10,780ක අධිභාරය ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. | සභා අරමුදලින් ගෙවූ අධිභාර මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතු වේ. | එවකට සිටි විෂයභාර නිලධාරිනිය සම්බන්ධ තොරතුරු සොයා බලා අදාළ මුදල අයකර ගැනීමට කටයුතු සුදානම් කර ඇත. |
| (ඉ) | <u>නීතිඥ ගාස්තු ගෙවීම</u> | | |
| | පුත්තලම සෙනකුඩිරුප්පුව ගමේ පිහිටි අක්කර 01, රූඩ් 02, පර්චස් 33ක් විශාල "කහනියර් පුවර් තෝට්ටම්" නැමති ඉඩම සම්බන්ධයෙන් පුත්තලම දිසා අධිකරණයේ විභාග වූ අංක 1390/L දරන නඩුව සඳහා නීතිඥ ගාස්තු වශයෙන් රු.207,000ක් ගෙවා තිබුණි. මෙම ඉඩමේ අයිතිය තහවුරු කිරීමට නගර සභාවට කිසිදු සාක්ෂියක් නොමැතිවීම මත නගර සභාවට අවාසි වන ආකාරයට නඩු තීන්දුව ප්‍රකාශකර තිබුණු අතර පැමිණිලිකරුට නඩු ගාස්තු ගෙවිය යුතු බවට තීරණය වී තිබුණි. තවද, නඩුවට පෙනී සිටි දින 48කට හා නඩුව විභාග වූ දින 12ක්ද ඇතුළුව දින 60ක් සඳහා රු.192,000ක් නීතිඥ ගාස්තු වශයෙන් ගෙවීමට සාක්ෂි වශයෙන් ඉදිරිපත්කර තිබුණේ නීතිඥවරයාගේ පෞද්ගලික දින පොතෙහි පිටපතක් පමණි. | සභා සතු ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු අතර, අදාළ දිනවල නීතිඥවරයා නඩුවට පෙනී සිටි බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අදාළ ඉඩමේ අයිතිය නගර සභාව සතු බවට තහවුරුකර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි සභාව සතුව නොපැවතුණු බැවින් පැමිණිලිකරුගේ වාසියට තීන්දුව ලැබී ඇත. සභාව විසින් නඩු දින තහවුරුකර ගැනීම සඳහා පුත්තලම දිස්ත්‍රික් උසාවිය වෙත තොරතුරු ඉල්ලා ඇති නමුත් මේවන තෙක් පිළිතුරු ලැබී නොමැත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සභාවේ විධායක තනතුර වර්ෂ කිහිපයක සිට පුරප්පාඩු වී පැවති අතර ද්විතියික තනතුරු අනුමත ප්‍රමාණයෙන් අඩක් පුරප්පාඩු වී තිබුණි. ප්‍රාථමික තනතුරු තුල අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා විධිමත් පත්වීම් ලිපි ලබා නොදුන් කම්කරුවන් හා සේවකයින් 77 දෙනෙකු බඳවාගෙන වැටුප් ගෙවමින් තිබූ අතර එම තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අනුමැතිය රහිත තනතුරු අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු හා අතිරික්ත තනතුරු අනුමත කර ගැනීම පිළිබඳව පළාත් පාලන කොමසාරිස් හා ප්‍රධාන ලේකම් දැනුවත් කර ඇත. |
| **(ආ) සේවක ණය** | | |
| විශ්‍රාම ගිය, ස්ථාන මාරුවී ගිය හා සේවය හැර ගිය සේවකයින් 77 දෙනෙකුගෙන් අයවිය යුතු රු.196,320ක් වූ ණය ශේෂයක් වර්ෂ 03ට වැඩි කාලයක සිට පැවතුණි. | අයවීම ඇණහිට ඇති සේවක ණය ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගතයුතු වේ. | වර්ෂ ගණනාවක සිට පැවත එන සේවක ණය ශේෂය පිළිබඳව තොරතුරු කිසිවක් සොයා ගැනීමට නොහැකි බැවින්, එම ශේෂය ලේඛනවලින් ඉවත් කිරීමට සභා තීරණයක් ගෙන පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ඉල්ලා ඇතත් මේ වන තෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නැත. |
| **(ඇ) සේවක ඇප** | | |
| 2008, 2016 සහ 2019 යන වර්ෂවල පුද්ගලයන් 31 දෙනෙකුගෙන් අයකර තිබුණු රු.42,698ක ඇප මුදල් ආයෝජනය කර නොතිබුණි. | සේවක ඇප මුදල් ආයෝජනය කළ යුතු වේ. | ඒ පිළිබඳව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් සිටිමි. |

**3.4 නිශ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.1,126,203ක් වූ රෝද හතරේ ට්‍රැක්ටරයක්, ගල්රෝලක්, රෝද දෙකේ ට්‍රැක්ටරයක් හා යතුරු පැදි තුනක් වසර 5 සිට 7 දක්වා කාලයක් නිශ්ක්‍රියව පැවතුණි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන තාක්ෂණික ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත 37-8589 අංක දරන ට්‍රැක්ටර් රථය, 156-7580 අංක දරන යතුරු පැදිය, HY 8815 අංක දරන යතුරු පැදිය සහ |

| | | |
|---|---|---|
| | | HL-M99 අංක දරන Land master වෙන්දේසියේ විකිණීමටත් RR-99 අංක දරන Road Roller යන්ත්‍රය පුරාණ භාණ්ඩයක් වශයෙන් ප්‍රදර්ශනය කිරීමටත් සභා තීරණයක් ගෙන ඇත. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් වාර්ෂිකව පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා බල ප්‍රදේශයේ සුභසාධක කටයුතු සහ සභාවේ කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 31ක් සඳහා ඇස්තමේන්තු කර තිබුණු රු.77,095,000ක මුළු ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා වැය කර නොතිබුණි. | වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති කාර්යයන් වර්ෂය තුල සිදු කළ යුතු වේ. | මධ්‍යම රජය නිකුත් කළ මූල්‍යමය නියෝග වන රථවාහන මිලදී ගැනීමට වෙන් කළ ප්‍රතිපාදන ඉතිරි වූ අතර, අදාල අනුමැතීන් හා තක්සේරු වාර්තා නොලැබීම මත ඉඩම් මිලදී ගැනීමට වෙන් කළ ප්‍රතිපාදන ඉතිරි විය. රට තුල පැවති අන්තවාදී ගැටුම් හේතුවෙන් යෝජිත වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමෙන් සෙසු ප්‍රතිපාදන ඉතිරි වූ බව වාර්තා කරමි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, 2019 ජනවාරි මාසයේ ගෙවීම් වවුචර් පරීක්ෂාව පමණක් අභ්‍යන්තර විගණනය ලෙස සිදු කර තිබුණි. | ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණුකිරීම හා එහි කාර්යසාධනය ඉහළ නැංවීමට හැකි වන පරිදි අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු වේ | 2019 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොමැති අතර, 2020 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන කටයුතු විධිමත් පරිදි සිදු කිරීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් එම අංශය වෙත ලබාදීමට කටයුතු කරන බව වාර්තා කරමි. |